# නාට්‍ය හා රංගකලාව

## 09 ශ්‍රේණිය

### 02 වන වාරය



**සැකසුම :**

නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුව

**W.N ඉරේෂා විජේසුන්දර,**

**L.H සුදේෂා ලක්මාලි,**

ර/නිවි/අයගම රාහුල විද්‍යාලය.

**සංස්කරණය :**

**M.D උත්පලා ධනංජනී,**

ර/නිවි/කලවාන ජාතික පාසල

සදීශා ජයසූරිය,

ර/නිවි/සිංහලගොඩ විද්‍යාලය

**අධීක්ෂණය -**

ප්‍රියංවදා ගොඩගේ,

ගුරු උපදේශක ( නාට්‍ය හා රංගකලා )

නිවිතිගල අධ්‍යාපන කාර්යාල

# මෙහෙයවීම-

මනෝරි උග්ගලගේ,

සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ

(සෞන්දර්ය)

නිවිතිගල අධ්‍යාපන කාර්යාලය



## නිපුණතාව 4.0 : නාට්‍ය හා රංගකලාව විෂයට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිලි කරයි.

## නිපුණතා මට්ටම 4.1 : දේශීය නාට්‍ය කලාවේ ඉතිහාසය හා සබැඳි නාට්‍යයේ අංකුර අවස්ථා අධ්‍යයනය කර එහි ඇති ප්‍රාසාංගික ලක්ෂණ හඳුනා ගනියි.

# දේශීය නාට්‍යය කලාවේ ඉතිහාසය හා බැඳි නාට්‍යමය අංකුර අවස්ථා අධ්‍යයනය

- බෞද්ධ පූජා කර්ම පිළිබඳ ව අවබෝධ කරවීමේ දී පොත්පත් පරිහරණය කළ නොහැකි සාමාන්‍ය ජනතාවට ධර්මය පිළිබඳ අවබෝධ කර දීම පිණිස විවිධ බෞද්ධ කතා අනුකරනය කිරීම සහ එම කතාවල විවිධ අවස්ථා නිරූපණය කිරීම සඳහා ධර්ම කතික භික්ෂූන් වහන්සේලා ඇතුළු උපාසක පිරිස ක්‍රමවේදයක් අනුගමනය කර ඇත.
- ධර්ම දේශනය අතරමැද කොටස් උපාසකයින් ලවා නිරූපණය කර පෙන්වා ඇත. එමඟින් කතාවේ අර්ථය සේම එහි ඇති ධර්ම කරුණු පිළිබඳව ද පහසුවෙන් අවබෝධ කරවීමට හැකිවිය.

ඒ සඳහා විශේෂ වූ බෞද්ධ ආගමික පූජා කර්ම කිහිපයකි.

1. ආලවක දමනය
2. මිලින්ද ප්‍රශ්නය
3. දොරකඩ හස්න
4. පිරිත් පිංකම
   (පාඩම සාකච්ඡාවේ දී වැඩි දුර සාකච්ඡා කෙරේ.)

## 1. ආලවක දමනය

අලවුරට පාලනය කළ රජු මුව දඩයමේ ගිය විට ආලවක යක්ෂයා මුණ ගැසුණි. ඔහුගෙන් බේරීම සඳහා දිනපතා දරුවකු බැගින් බිලි දීමට පොරොන්දු වී රජු ආපසු යයි. මෙසේ රජුගේ දරුවා බිලි දීමට දිනය උදා විය. එය දැනගත් බුදුන්වහන්සේ එතනට වැඩම කළහ. බුදුන් දුටු විමානයේ මුරකරු වූ ගද්‍රභ යක්ෂයා උන්වහන්සේ එතනින් ඉවත් කිරීමට බොහෝ වෙහෙසුන ද එය කිරීමට නොහැකි විය. යක්ෂ සමාගමෙන් ආපසු පැමිණි අලවු යකු බුදුන් ඉදිරියේ සැර පරුෂ සේ හැසිරුණි.

උදා:- (ආලවක හා ගද්‍රභ යක්ෂයා අතර සංවාදය)

ගද්‍රභ : මේ විමානයට වැඩියේ ඇයි?
භික්ෂුව : උවමනාවක් නිසා තමයි ආවේ ඔබ ඉඩ දෙනවනම් මම කැමතියි මෙහි රාත්‍රිය ගත කරන්න.

ගද්‍රඹ : අනේ ස්වාමීනී, මේක ආලවකයගෙ විමානෙ. පේනව නේද? හැමතැන ම මිනී කාලා
ලේයි ඇටකටු ගොඩයි. මෙතන හිටියොත් ඔබ වහන්සේට මොනවා වෙයි ද හිතාගන්න බෑ.
භික්ෂුව : යකාගෙ නපුරුකමින් මට වැඩක් නෑ මම අද මෙතන නවතිනවා.

මේ ආකාරයට යකා පැමිණි පසු ද කතා බහක යෙදෙයි. අවසානයේ දී යකා බණ අසා බුදුන් සරණ යයි. මෙම සිදුවීම සජීවීව ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ ඉදිරිපත් කරනු ලබන අතර රඟපාන විට පෙන්විය නොහැකි දේ භික්ෂූන් වහන්සේලා විසින් දේශනා කරයි. භික්ෂූන් වහන්සේ විසින් බුදුන් වහන්සේ නියෝජනය කරයි....

- මේ අවස්ථාවේ දී පසුබිමින් බෙර වාදනය ඇසේ පන්දම් මඟින් ආලෝකය ලබාදෙයි හූ හඬ නගාගෙන කලු රතු ඇඳුම් ඇඳගෙන බෙර වාදනයට අනුව යක්ෂ වෙස් ගත් නළුවන් වේදිකාවට පැමිණේ.

ආලවක දමනය තුළ දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ,

- අනුකරණය - යක්ෂයා ලෙස ගිහියෙක් වෙස්ගෙන පැමිණ රඟ දැක්වීම.
- සමාරෝපය - යක්ෂයා ලෙස ඇඳුම් පැළඳුම් ඇඳ තිබීම.
- බුදුන් ලෙස භික්ෂුවක් පෙනී සිටීම.
- සංවාද භාවිතය - (ගද්‍රඹ හා භික්ෂුව අතර සංවාදය)
- රංග භූමිය - පන්සලේ ධර්ම ශාලාව
- ප්‍රේක්ෂකයෝ - (උපාසක උපාසිකාවන්)
- සංගීතය - බෙර වාදනය
- ආලෝකය - පන්දම් එළි භාවිතය
- අංග රචනය - යකෙකු සේ මුහුණ සකස් කිරීම.
- වේෂභූෂණ - යකෙකු ලෙස ඇඳුම් ඇඳීම.
- නළු නිළියෝ - භික්ෂුව හා ගද්‍රඹ ලෙස පෙනීසිටි උපාසකයන්

මෙසේ නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවක් දැකිය හැකි අතර මෙම පූජා කර්මය තුළ ප්‍රාසාංගික ලක්ෂණ බොහෝමයක් ද දැකිය හැකිය.(පාඩම සාකච්ඡා කිරීමේ දී ඔබට විසතරාත්මක ව දැනගත හැකි වේ.)

## 2. මිලින්ද ප්‍රශ්නය

මෙහි දී නාගසේන හිමියන්ගෙන් මිලිඳු රජු ප්‍රශ්නය පිළිබඳ ව ඉදිරිපත් කෙරේ.

උදා:- මිලිඳු රජු - ස්වාමීනි ඔබ වහන්සේ කවර නම් වීද?
නාගසේන හිමි - මහරජතුමනි මම නාගසේන වෙමි.
මිලිඳු රජු - නාගසේන වූයේ කවරෙක් ද? හිසකේ නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිඳු රජු - එසේනම් නියපොතු, දත්, සම්, මස්, නහර ආදිය නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිඳු රජු - එසේනම් රූපය වේදනාව ආදිය නාගසේන ද?
නාගසේන හිමි - නැත මහරජ
මිලිඳු රජු - එසේනම් ස්වාමීනී නාගසේන කෙනෙක් නැත
නාගසේන හිමි - මහරජ කිමෙක් ද තෙපි පයින්ද අයේ ද?

මිලිඳු රජු - සවාමීනි මම රථයෙන් ආමි....

මෙසේ දීර්ඝ ව සාකච්ඡාවක නිරත වීම සිදුවේ. මේ තුළ දැකිය හැකි නාට්‍යයමය අංකුර අවස්ථා ගණනාවකි.

- අනුකරණය - ගිහියෙක් රජු ලෙස ඉදිරිපත් කිරීම් කිරීම.
- සමාරෝපය - ගිහියෙක් රාජාභරණ හා කිරුළ පැළඳ මිලිඳු රජු ලෙස සැරසීම.
- සංවාද භාවිතය (මිලිඳු රජු හා භික්ෂුව අතර සංවාදය)
- වේශභූෂණ - මිලිඳු රජුගේ රාජ ඇඳුම්
- අංග රචනය - මිලිඳු රජු ලෙස මුහුණ සකස් කිරීම.
- අලෝකය භාවිතය - පන්දම් භාවිතය
- ප්‍රේක්ෂකයා (උපාසක උපාසකයන්)
- සංගීතය (විවිධ ශබ්ද භාවිතා කිරීම)
- නළු නිළියන් (මිලිඳු රජු ලෙස සැරසුන උපාසකයන්)

මෙසේ නාට්‍යමය අංකුර අවස්ථා ගණනාවක් මිලින්ද ප්‍රශ්නය තුළ දැකිය හැකි ය. (පාඩම සාකච්ඡා කිරීමේ දී වැඩිදුර විස්තර කෙරේ.)

## 3. දොරකඩ හස්න

මෙහි කතාව වන්නේ සති පිරිත අවසානයේ ලිරිත් ඇසීමට දෙවිවරුන්ට ආරධනා කිරීමය. ඉතාමත් ගෞරවාන්විත ව තල් ගොබයක පත් ඉරුවල දේව ආරාධනා ලියා එය සරසනු ලැබූ ලීයක දෙපස රඳවයි. දේව දූතයකු සේ සැරසුන පිරිමි ළමයෙකු පෙරහැරකින් තල්පත් රැගෙන දේවාල වෙත යයි. දේවාලයේ සතර කොන දේව ආරධනා පත් එල්ලූ පසුව පෙරහැර නැවත විහාරය වෙත පැමිණේ.

දේව දූතයා කඩුගත් රැකවලුන් මුර කරන කාමරයක රඳවා තබයි. රාත්‍රී පිරිතට වඩින භික්ෂූන් සමඟ දේව දූතයා පෙරහැරින් පිරිත් මණ්ඩපය වෙත එයි.

දොරටුව ළඟ සිටින දේව දූතයා සහ භික්ෂුක හා සංවාදයේ යෙදේ.(විචිත්‍රවත් සංස්කෘත පද බහුල මිශ්‍ර සිංහල බසින් මෙම සංවාදය ඉදිරිපත් කෙරේ)

භික්ෂුවගේ ප්‍රශ්න විචාරීමට අනුව දේව දූතයා දොරකඩ හස්න ශබ්ද නගා කියවයි. දොරකඩ හස්න කියවූ පසු අනුශාසනා ඉදිරිපත් කෙරේ.

මෙහි නාට්‍යමය අවස්ථා -

- අනුකරණය - දේව දූතයෙකු ලෙස හැසිරීම.
- සමාරෝපය - දේව දූතයෙකු ලෙස වෙස් ගැනීම.
- සංවාද භාවිතය - දේව දූතයා හා භික්ෂුව අතර සංවාදය.
- නාට්‍යය උපකරණ භාවිතය - තල් පත කත් ලීයක එල්ලීම.
- ප්‍රේක්ෂකයෝ - පිරිත් ඇසීමට ආ පිරිස
- අංග රචනය - දේව දූතයෙකු ලෙස ඇඳුම් පැළඳුම්වලින් සැරසීම.
- ආලෝකය භාවිතය - පන්දම් එළි භාවිතය
- වේදිකාව - පිරත් මණ්ඩපය

වැනි අවස්ථා සේම ප්‍රාසාංගික ලක්ෂණ ද දැකිය හැකි ය.

## 4. යුගාසන බණ

එකම ධර්ම ශාලාවක වැඩ හිඳ ධර්මයෙහි කොටස් මාරුවෙන් මාරුවෙන් මාරුවට දේශනා කිරීම හෝ ප්‍රශ්නෝත්තර මඟින් දේශනා කිරීම මෙමඟින් අදහස් කෙරේ. ධර්ම ගැටලු විසඳයි අතීත කතාවක් වචන මඟින් ප්‍රතිනිර්මාණය කරන මෙම අවස්ථාව තුළ ද නාට්‍යමය අංකුර අවස්ථා දැකිය හැකිය.

- සමාරෝපය - ධර්ම දේශනා කරන භික්ෂූන් ලෙස පෙනී සිටීම.
- සංවාද භාවිතය - මාරුවෙන් මාරුවට දේශනා කිරීම හෝ ප්‍රශ්නවලට උත්තර සැපයීම.
- ආලෝකය - පන්දම් භාවිතය
- ප්‍රේක්ෂක සහභාගීත්වය - උපාසක උපාසිකාව

**මිලින්ද ප්‍රශ්නය**

https://youtu.be/Wp5diEe__B4

**දොරකඩ අස්න**

https://youtu.be/RsmR49Phs2w

**පිරිත් පිංකම**

https://youtu.be/VmGBGEdO3Xg

**-පැවරුම්-**

1. පූජා කර්ම කීපයක් නම් කරන්න.

2. එක් පූජා කර්මයකට පාදක වූ කතාවක් ලියන්න.

3. ඔබ කැමති පූජා කර්මය විස්තර කර එහි නාට්‍යමය අංකුර අවස්ථා දක්වන්න.

4. පූජා කර්ම අවස්ථාවක් තේමා කරගෙන කෙටි නාට්‍යය පෙළක් රචනා කරන්න.

# නිවිතිගල කලාපීය නාට්‍ය හා රංගකලා ගුරු එකමුතුවේ සැකසුමකි.